**මාධ්‍ය නිවේදනය**

**2021 මැයි මස 28 වන දිනදීය**

**කොළඹ :**

## මධ්‍යම තැන්පතු ක්‍රමය (CDS) සිය සේවා සැපයුම විවිධාංගීකරණය කරයි

කොළඹ කොටස් වෙළඳපොලේ (CSE) පූර්ණ අනුබද්ධිත සමාගමක් වන මධ්‍යම තැන්පතු ක්‍රමය (CDS) මෑතකදී සිය සේවා සැපයුම විවිධාංගීකරණය කළේය. ගෝලීය වශයෙන්, මධ්‍යම තැම්පතු ක්‍රමයන්හි සාම්ප්‍රදායික කාර්යභාරය වන්නේ නව තාක්ෂණයේ උද්දීපනයත් යොදා ගනිමින් ගනුදෙනු කරුවන් කේන්ද්‍ර කරගත් නව්‍ය වූ සේවාවන් සැපයීමයි. එයනුකූලවම, ශ්‍රී ලංකාවේ මධ්‍යම තැම්පතු ක්‍රමයද තම ගමන් මාර්ගය තුළ විවිධ ඉසව්වාන් කරා සේවාවන් විවිධාංගීකරණය කර ඇත.

## මධ්‍යම තැන්පතු ක්‍රමය (CDS) ශ්‍රී ලංකාවෙ ප්‍රාග්ධන වෙළඳපොල තුළ තම ස්ථාවරත්වය තහවුරු කරගැනීම

කොළඹ කොටස් වෙළෙඳපොලෙහි කර ඇති සුරැකුම්පත් සඳහා රටේ එකම තැන්පත් කරුවා ලෙස කටයුතු කිරීමේ වගකීම ඇතිව මධ්‍යම තැන්පතු ක්‍රමය (CDS) ආයතනය ප්‍රථම වරට ශ්‍රී ලංකා ප්‍රාග්ධන වෙළඳපොළට 1991 දී අවතීර්ණ වුනු අතරම දේශීය හා ජාත්‍යන්තර ගනුදෙනුකරුවන් සඳහා සුරැකුම්පත් ගනුදෙනු කිරීම, සුරැකුම්පත් ආරක්ෂා කිරීම, ගනුදෙනු සමථ කිරීම ආදී ක්‍රියාවන්හි සුවිශේෂීකරණය වූ සේවාවන් සැපයීම සඳහායි මෙය පිහිටුවන ලද්දේ. ජාත්‍යන්තර ආයෝජකයින් සඳහා ශ්‍රී ලාංකික ප්‍රාග්ධන වෙළඳපොළේ ප්‍රධාන යටිතල පහසුකම් සපයන්නා ලෙස මධ්‍යම තැන්පතු ක්‍රමය (CDS) පිහිටුවා ඇත. දැනට මධ්‍යම තැන්පතු ක්‍රමයෙහි හි ප්‍රධාන කාර්යභාරයන් ලෙස, ලැයිස්තුගත සමාගම් ගිණුම් හිමියන්ගේ භාරකරු ලෙස සහ ද්‍රවශීලතා සැපයුම්කරුවෙකු ලෙස කටයුතු කිරීම හඳුනාගත හැකිය. ගිණුම් ගණන, භාරයේ ඇති සුරැකුම්පත් ප්‍රමාණය සහ තැන්පතුවල ඇති සුරැකුම්පත් වල වටිනාකම ආදිය තුළින් ආයෝජකයින්ගේ විශ්වාසයද තහවුරු කරගෙන ඇත.

මෙසා විශාල දත්ත ප්‍රමාණයක් පවත්වා ගැනීම විශාල අභියෝගයක් වුවත් කොටස් හුවමාරුවේ තිරසාර පැවැත්ම සඳහා එය තීරණාත්මක කාර්යභාරයකි. ප්‍රාග්ධන වෙළඳපොළට සේවය කිරීම පිළිබඳ දශක තුනක පෘථුල අත්දැකීම් තුළින් ආසියා පැසිෆික් කලාපයේ පළමු හා ලෝකයේම හත්වැනි ස්ථානයටත් පත්වෙමින් ඇති මධ්‍යම තැන්පතු ක්‍රමය (CDS) ගෝලීය වශයෙන් තම කීර්තිය වර්ධනය කරගෙන ඇත. මධ්‍යම තැන්පතු ක්‍රමයහි වර්තමාන පෘථුලත්වය මත ක්ෂේතයට සේවය කිරීමේ ශක්‍යතාවයෙන් හා ධාරිතාවයෙන් සන්නද්ධව එහි අනාගත සේවා පුළුල් කිරීමට සාර්ථකව සහාය දැක්වීමේ හැකියාව ඇත. ඉතිහාසය පුරා මේ දක්වා කිසිදු බාධාවකින් තොරව නිෂ්කාශනය කරන ලද සහ සමථ කරන ලද ගනුදෙනු ගණන මගින් මෙය තහවුරු වෙයි.

## <u>මධ්‍යම තැන්පතු ක්‍රමය සේවාවන් විවිධාංගීකරණය කිරීම</u>

කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ ලැයිස්තුගත සමාගම්වල නිකුත් කිරීම් සඳහා රෙජිස්ට්‍රාර් සේවාවන් ඇතුළත් කිරීම සඳහා මධ්‍යම තැන්පතු ක්‍රමය (CDS) ඔවුන්ගේ සේවා පිරිනැමීම් පුළුල් කර ඇති අතර එය ඔවුන්ගේ වටිනාකම් දාමයට උසස් සංකලනයකි . මෙම හඳුන්වාදීමත් සමඟ, කොළඹ කොටස් වෙළෙඳපොලෙහි නවතම ලැයිස්තුගත කිරීම වන ක්‍රිස්වර්ල්ඩ් සමාගම විසින් මධ්‍යම තැන්පතු ක්‍රමයෙහි රෙජිස්ට්‍රාර් සේවාවන් ලබාගන්නා ලදී.. මධ්‍යම තැන්පතු ක්‍රමය (CDS) විසින් ක්‍රිස්වර්ල්ඩ් මූලික මහජන නිකුතුව (IPO) සඳහා ඊ-අයිපීඕ (e- IPO) ක්‍රමය නව අංගයක් ලෙස ද එක් කරන ලද අතර එමඟින් තවදුරටත් විධිමත් IPO ක්‍රියාවලියක් සක්‍රීය කෙරුනි.

මෙම නව එකතු කිරීම් පිළිබඳව අදහස් දැක්වූ මධ්‍යම තැන්පතු ක්‍රමයෙහි ප්‍රධානී නලින් ෆොන්සේකා මහතා මෙසේ පැවසීය. “ප්‍රාග්ධන වෙළඳපොළ ආරක්ෂිත මෙන්ම පහසු විසඳුම් තුළින් මෙහෙයවෙනු ලැබෙනු අතර, ශ්‍රී ලංකා කොටස් වෙළඳපොලේ වැදගත්ම සාධකය නම් අප සැමවිටම මෙහෙයවනු ලැබුවේ අපගේ මුඛ්‍ය ක්‍රියාවන්ගෙන් ඔබ්බට යාමට සහ පාර්ශවකරුවන්ට ප්‍රමුඛතාවය ලබාදෙන එසේම විවිධාංගී කරණය වූ සේවා සපයන්නෙකු ලෙස හැඩගැසීමටයි. මධ්‍යම තැන්පතු ක්‍රමය (CDS) ඉතිහාසය පුරා, වෙළඳපල තිරසාරභාවය සඳහා එකම මාර්ගය ආයෝජකයින්ගේ විශ්වාසය බව අපගේ නිරන්තර විශ්වාසයයි. සේවා ප්‍රමිතිය සහ ආයෝජකයින්ගේ විශ්වාසය ඉහළ නැංවීමේ අරමුණින් මෙම විවිධාංගීකරණ මෙහෙයුම දියත් කරන ලදී.

මධ්‍යම තැන්පතු ක්‍රමයහි විවිධාංගීකරණ ප්‍රවේශය පිළිබඳව තවදුරටත් පැහැදිලි කළ ඔහු, මධ්‍යම තැන්පතු ක්‍රමය තවත් පියවරක් ඉදිරියට යමින් වත්කම් සේවා කෙරෙහි මුළුමනින්ම අවධානය යොමු කළ හැකි විශේෂිත ඒකකයක් ආරම්භ කර ඇති බව පැවසීය. මෙම ඒකකයේ මෙහෙයුම් පූර්ණ ලෙසම මධ්‍යම තැන්පතු ක්‍රමය යටතට ගැනෙන අතර මෙහෙයුම් සකස් කිරීම වසර තුනකට පෙර සිට සිදු කරන ලදී. මෙම ඒකකය විසින් සපයනු ලබන සේවාවන් මගින් ලැයිස්තුගත සමාගම්වලට සහ ආයෝජකයින්ට විවිධ ප්‍රතිලාභ ලබා දෙයි. ඕනෑම ආකාරයක සංස්ථාපිත ක්‍රියාමාර්ගයක් හැසිරවීමේ හැකියාව මෙම ඒකකයට ඇත. “හොඳම උදාහරණය වන්නේ ලාභාංශ ගෙවීමයි. සමාගම ප්‍රකාශ කළ දිනයටම, ලැයිස්තුගත සමාගම විසින් විද්‍යුත් ක්‍රමවේද භවිතා කොට ගිණුම් හිමියන්ගේ බැංකු ගිණුමට සෘජුවම ලාභාංශ ගෙවීමයි”

## <u>තාක්ෂණයෙහි උද්දීපනය</u>

දෛනික මෙහෙයුම් කටයුතු සඳහා මධ්‍යම තැන්පතු ක්‍රමය (CDS) විසින් අනුගමනය කරන අති නවීන තාක්‍ෂණය සංවිධානය සතු ධාරිතාවයට තවත් සාක්ෂියකි. මධ්‍යම තැන්පතු ක්‍රමය (CDS) තම නිරන්තර වර්ධනය සඳහා තාක්ෂණයේ ප්‍රධාන ස්ථම්භය ලෙස හඳුනා ගෙන ඇති අතර ක්ෂේත්‍රයට විවිධාකාර වූ සේවාවන් ලබා දීම සඳහා තාක්‍ෂණය මගින්ම මධ්‍යම තැන්පතු ක්‍රමය උද්දීපනය ලබා ගනී.

තාක්‍ෂණික පරිසර පද්ධතිය දිරිගැන්වීමේ නිරන්තර ප්‍රයත්නයේදි සහ අනාගත ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීමට උත්සාහ කිරීමේදී මධ්‍යම තැන්පතු ක්‍රමය (CDS) විවිධ විසඳුම් ලබා දී ඇත. මෑතකදී දියත් කරන ලද මාර්ගගත IPO අයදුම් ක්‍රමවේදය, ආයෝජක ප්‍රජාව අතර ප්‍රචලිතවූ එවැනි උන්නතියකට උදාහරණයකි. මෙය සැලකිය යුතු පිරිවැටුම් වර්ධනයකට සහ ජංගම යෙදුම් බාගත කිරීම්හි කැපී පෙනෙන වර්ධනයකට දායක වී තිබේ. වර්තමානයේ මෙම පහසුකම ලබා ගත හැක්කේ දේශීය ආයෝජකයින් සඳහා පමණක් වන අතර නුදුරු අනාගතයේදී එය විදේශීය ආයෝජකයින් දක්වා ව්‍යාප්ත කිරීමේ වැඩපිළිවෙල සැකසෙමින් වෙමින් පවතී.

මධ්‍යම තැන්පතු ක්‍රමය (CDS) විසින් ප්‍රමුඛ පෙළේ ලැයිස්තුගත සමාගම් කිහිපයකට වාර්ෂික මහා සභා රැස්වීම් (AGM) හතක් හසුරුවා ඇති අතර එය අභෞතික සම්මේලන හසුරුවන පළමු සේවා සැපයුම්කරු ලෙස සැලකේ. COVID වසංගතය තුළ අභෞතික වාර්ෂික මහා සභා රැස්වීම් (AGM), සමාගම් සහ ආයෝජකයින් සඳහා වටිනා ප්‍රවේශයක් ලෙස ක්‍රියා කළ අතර එමඟින් ක්‍රියාවලීන් සුමටව කරගෙන යාමට හැකි විය.

ආයෝජකයින්ගේ ගිණුම් විවෘත කිරීම, කොටස් වෙළඳපල ආයෝජනයන් සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. එබැවින්, තැරැව්කාර සමාගම් නියෝජිතයින්ගේ විශාල දායකත්වයත්ද සමගින් හඳුන්වා දෙන මාර්ගගත ගිණුම් විවෘත කිරීමේ ක්‍රමවේදය (CSE Mobile App) භෞතික ලේඛන ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව නිෂ්ක්‍රීය කරමින් ආයෝජකයින් විශාල ගණනක් වෙළඳපොළට ආකර්ෂණය කර ගත්තේය. කොළඹ කොටස් වෙළෙඳපොල සහ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ ඒකාබද්ධ කමිටුව විසින් ආරම්භ කරන ලද මෙම මුලපිරීම ආයෝජක ප්‍රජාවගේ ආකර්ෂණය දිනා ගනු ලැබුණි.

ආයෝජක ප්‍රජාව සඳහා සමස්ත කොටස් වෙළෙඳපොලම මාර්ගගත හා විද්‍යුත් කරණයට පත් කළ හැකි වෙතැයි මධ්‍යම තැන්පතු ක්‍රමය (CDS) දැඩි විශ්වාසයෙන් සිටී. අනාගත විද්‍යුත් කරණ වර්ධනයන් පිළිබඳව අදහස් දක්වමින් මධ්‍යම තැන්පතු ක්‍රමය (CDS) මෙසේ අදහස් දැක්වීය. “එක බොත්තමක් එබීමෙන් සරල එසේම පහසුවෙන් ආයෝජකයින්ට සියළුම CDS ගිණුම් අවශ්‍යතා වෙත ප්‍රවේශ වීම සඳහා අපි විශේෂිත විද්‍යුත්-ප්‍රවේශ ක්‍රමවේදයක් සකස් කරමින් සිටිමු. මෙම පහසුකම 2021 අවසානය වන විට දියත් කිරීමට අපේක්ෂා කෙරේ. මෙම මුලපිරීම මධ්‍යම තැන්පතු ක්‍රමය (CDS) සාක්ෂාත් කර ගැනීමට නිරන්තරයෙන් උත්සාහ කරන වගකිවයුතු පාරිසරික, සමාජීය හා ආයතනික පාලන (ESG) අංගයට සමපාත වෙයි. ආයෝජක ප්‍රජාවට සහ ලැයිස්තුගත සමාගම්වලට සියලු මාර්ගගත යොමු කිරීම් විසඳුම ලබාදෙන ද්වාරය වන විද්‍යුත්-සබැඳියා (e-connect) ක්‍රියාත්මක කිරීම සමඟ කඩදාසි ලේඛන ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය මුළුමනින්ම එමගින් ප්‍රතිස්ථාපනය වේ. ”

-----------------------------------------------------------------------------------------------------------------------

**<u>කොළඹ කොටස් හුවමාරුව පිළිබඳව:</u>**

**කොළඹ කොටස් හුවමාරුව ශ්‍රී ලංකාවේ එකම කොටස් වෙළෙඳපොළ ලෙස ක්‍රියාත්මක වන අතර එමගින් ලයිස්තුගත සමාගම් හා ආයෝජකයන්ට හමුවීම සඳහා අවශ්‍ය පාරදෘශ්‍ය හා විධිමත් පරිසරය සකස් කෙරෙයි. සාමාජික ආයතන 15 කින් හා ගනුදෙනුකරන සාමාජික ආයතන 15 කින් සමන්විත මෙය ශ්‍රී ලංකාවේ නෛතික රාමුවට අදාලව ඇපයෙන් සීමිත සමාගමක් ලෙස ලියාපදිංචි කර තිබෙන අතර ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිසන් සභාව මගින් අධිකාරිය ලබා තිබේ. මෙම සියලුම සාමාජික ආයතන හා ගනුදෙනුකරන සාමාජික ආයතන කොටස් තැරැව්කරුවන් ලෙස ක්‍රියාත්මක වීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිසන් සභාව මගින් බලපත්‍ර ලබාගත යුතුය. වැඩි විස්තර www.cse.lk වෙබ් අඩවියෙන් ලබාගත හැක.**


**වැඩි විස්තර සඳහා අමතන්න ,**

**නිරෝෂන් විජේසුන්දර , කොළඹ කොටස් හුවමාරුව**

**දුරකථන : + 94 112356510, ජංගම දුරකථන : + 94 777 819999, ෆැක්ස් : + 94 112445279**

**විද්‍යුත් තැපැල : niroshan@cse.lk**